# ජාතික රාජ්‍ය සභාවේ

# 1975 අංක 32 දරන බැංකු හර බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 සැප්තැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 32 දරන බැංකු හර බදු
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 31/74.

**1970 අංක 27 දරන බැංකු හර බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 32 දරන බැංකු හර බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1970 අංක 27 දරන බැංකු හර බදු පනතේ 3 වන වගන්තියෙහි (ආ), (ඇ) සහ (ඈ) ඡේද අත් හැරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1970 අංක 27 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) සෑම වාණිජ බැංකුවක් විසින් එක් එක් ලිත් මාසය අවසාන වීමෙන් පසු දින හැටක් ඇතුළත, එම බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන එක් එක් ජංගම ගිණුමෙහි ඇති මුදල අනුව, එම මාසය තුළ එම ගිණුමෙන් කරනු ලැබූ හර වෙනුවෙන් වූ බද්දට හෝ බද්දෙහි කොටසට සමාන මුදලක් එම ගිණුමෙන් ඉවත් කර ගත යුතු ය ; ඉනික්බිති, මේ උපවගන්තිය ප්‍රකාර ඉවත් කර ගන්නා ලද මුළු මුදලින් 6 වන වගන්තියෙහි සඳහන් ගාස්තුවෙහි මුදල අඩුකර ගැනීමෙන් පසු ඒ මුළු මුදලෙහි ඉතුරුව, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස, නියමිත ආකෘතියෙහි වූ එයට අදාළ ප්‍රකාශයකුත් සමඟ, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරී වෙත යැවිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත සෑම මාස තුනකටම වරක් යැවිය යුතු හරවල මුළු මුදල ආදියට අදාළ සහතිකය.

15. සෑම ලිත් මාස තුනක් අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ එම බැංකුවේ නිලධරයකු විසින්, එක් එක් වාණිජ බැංකුව සම්බන්ධයෙන්, එම වාණිජ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම්වලින් එකී මාස තුනේ කාලය තුළ කරනු ලැබූ බද්දට යටත් හරවල මුළු මුදල ද, ඒ හර වෙනුවෙන් ගෙවිය යුතු බද්දෙහි මුළු මුදල ද, බද්ද ගෙවීම වශයෙන් එම වාණිජ බැංකුව විසින් යවන ලද මුදල් ප්‍රමාණය ද, බද්ද අයකර ගැනීම

2—ඒ 15140—11,989 (75/07)

හා යැවීම සඳහා බැංකුවේ ගාස්තු වශයෙන් එම වාණිජ බැංකුව විසින් තබා ගන්නා ලද මුදල් ප්‍රමාණය සහ අයකර නොගන්නා ලද යම් බදු මුදලක් වේ නම් ඒ බදු මුදලේ ප්‍රමාණය ද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙත ලියවිල්ලකින් සහතික කර යැවිය යුතු ය. එම සහතිකය එය අදාළ වන ලිත් මාස තුන අවසාන වීමෙන් පසු දින හැත්තෑ හතරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යැවිය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙහි “ වාණිජ බැංකුව ” යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

‘ “ වාණිජ බැංකුව ” යන්නෙන් මුදල් නීති පනතේ අර්ථානුකූල වූ යම් වාණිජ බැංකුවක් අදහස් වේ ;’.